# පැමිණිලි කළහැකි ආයතන



## සයිබර් අවකාශය තුළ සිදුවන අපරාධ වැළැක්වීම හා වින්දිතභාවයට පත්වන පාර්ශවයන්ගේ ආරක්ෂාව සැලසීම සඳහා කටයුතු කරන ආයතන

**පරිගණක හදිසි සූදානම්තා කණ්ඩායම**

තොරතුරු සන්නිවේදනය උපයෝගී කරගනිමින් රාජ්‍ය ප්‍රතිපත්ති, ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීමේ මූලික අරමුණ ඇතිව 2003 අංක 27 දරන තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ පනත ඇති කරන ලදී. එහි ක්‍රියාකාරී යාන්ත්‍රණය වශයෙන් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ඒජන්සිය (Information and Communication Technology Agency of Sri Lanka – ICTA) පිහිටුවන ලදී. 2008 දී සිදුකරන ලද සංශෝධනයක් මගින් මෙම පනතේ කාර්යයන් පුළුල් පරාසයක් වෙත යොමු කර ඇති අතර මෙමගින් තොරතුරු සන්නිවේදන තාක්ෂණය ක්‍රියාත්මක කිරීමෙහිලා ජාතික ප්‍රතිපත්තියක් නිර්මාණය කිරීමට කටයුතු කරන අන්තර් අමාත්‍ය කමිටුවක් පිහිටුවා තිබේ.

මෙසේ තොරතුරු තාක්ෂණය සම්බන්ධව රාජ්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වන විට ඇතිවන සයිබර් ප්‍රහාර ඇතුළු අනෙකුත් ගැටලු නියාමනය කිරීමට හැසිරවීමට හා පාලනය කිරීමට ද ආයතනයක් ද ඇති කරන ලදී. එනම් 2006 වර්ෂයේ දී ICTA සහයෝගිත්වයෙන් ආරම්භ කරන ලද, පරිගණක හදිසි සූදානම්තා කණ්ඩායම (Computer Emergency Readiness Team- CERT) යි. ප්‍රධාන වශයෙන් හදිසි අවස්ථාවක දී ප්‍රතිචාර දැක්වීම, දැනුවත් කිරීමේ සේවා පවත්වාගෙන යාම, පර්යේෂණ කටයුතු සිදු කිරීම, ප්‍රතිපත්ති සංවර්ධනය සහ උපදේශන සේවා ලබා දීම වැනි කාර්යයන් මෙම ආයතනය විසින් සිදු කරනු ලබයි. එමෙන්ම රජයේ හෝ පුද්ගලික ආයතන වලට තොරතුරු තාක්ෂණය වඩා ආරක්ෂාකාරී ලෙස අවදානමකින් තොරව භාවිත කිරීමට අවශ්‍ය මග පෙන්වීම ලබා දේ. එමෙන්ම අන්තර්ජාලය හා සමාජ මාධ්‍ය භාවිතයෙන් සිදුවන විවිධ සිදුවීම් සම්බන්ධව දැනුවත් කිරීම හා සිදුවීමකින් පසු අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා මග පෙන්වීම සිදු කරනු ලබයි. නමුත් නීතිමය ක්‍රියාමාර්ග සඳහා මැදිහත් වීම, වරදකරුවන් සොයා දීම, වෙබ් අඩවි අවහිර කිරීම මෙම ආයතනය විසින් සිදු නොකරයි.

0112 691 692/ 0112 695 749/ 0112 679 888 යන දුරකථන අංක ඔස්සේ ශ්‍රී ලංකා පරිගණක හදිසි සූදානම්තා කණ්ඩායම ඇමතීමට හැකියාව ඇත. එමෙන්ම cert@cert.gov.lk යන විද්‍යුත් ලිපිනය හරහා තොරතුරු ලබා ගත හැකිය.

report@cert.gov.lk යන විද්‍යුත් ලිපිනය හරහා සමාජ මාධ්‍ය ආශ්‍රිත සිද්ධීන් වාර්තා කළ හැකිය.

**ශ්‍රී ලංකා පොලිසියේ සයිබර් අපරාධ අංශය**

යම් පුද්ගලයකු සයිබර් අපරාධයක ගොදුරක් බවට පත් වුවහොත් ළගම ඇති පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැක. දරුවකුට සිදුවන සයිබර් අපරාධයකදී පොලිස් ස්ථානයේ ළමා හා කාන්තා අපයෝජන නිවාරණ කාර්යාංශය වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කළ යුතු වන අතර එවිට අදාළ අංශ වෙත දැනුම් දී විමර්ශන කටයුතු සිදු කරනු ලැබේ.

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ මූලස්ථානයෙහි සයිබර් අපරාධ අංශයක් ස්ථාපනය කොට ඇත. යම් අයෙකුට සයිබර් අවකාශය ආශ්‍රිතව සිදුවන අපරාධයක් සෘජුවම මෙම අංශයට ද වාර්තා කළ හැකි අතර එමගින් විමර්ශන කටයුතු සිදු කර අදාළ අපරාධකරු නීතියේ රැහැනට හසුකර ගැනීම සිදු කෙරේ. 0112 326 979 යන සෘජු දුරකථන මාර්ගය ඔස්සේ සයිබර් අපරාධ අංශය හෝ 0112 320 141 යන අපරාධ විමර්ශන අංශයෙහි පොදු දුරකථන මාර්ගය ඔස්සේ සම්බන්ධ වී ඔවුන්ගෙන් උපකාර ඉල්ලා සිටිය හැක. එමෙන්ම dir.cid@police.lk සහ telligp@police.lk යන විද්‍යුත් ලිපිනයන් දෙකටම විද්‍යුත් ලිපි මගින් තොරතුරු ලබා දිය හැක.

**ජාතික ළමා ආරක්ෂක අධිකාරිය**

දේශය තුළ දරුවන්ගේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා සුවිශේෂ අධිකාරියක් පිහිටුවීමේ දිගුකාලීන අවශ්‍යතාව මල්ඵල ගන්වමින් 1998 වර්ෂයේදී ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පිහිටුවන ලදී. මෙම අධිකාරිය පිහිටුවන ලද්දේ 1998 අංක 50 දරන ජාතික ළමා ආරක්ෂක අධිකාරිය පනත යටතේය.

මෙම පනත මගින් දරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග ගැනීමට හා ඒ සඳහා රජයට මග පෙන්වීම හා ළමා අපයෝජන තුරන් කිරීමට ගත හැකි සියලු පියවරයන් ගැනීමට රජය හා සමග කටයුතු කිරීමට බලය ලබා දී ඇත. විශේෂයෙන්ම එම පනතේ 14(ඔ) වගන්තිය යටතේ ළමා අපයෝජන සම්බන්ධයෙන් පැමිණිලි ලබා ගැනීමටත් එම පැමිණිලි සම්බන්ධයෙන් අදාළ ක්‍රියාමාර්ග ගැනීමටත් අවශ්‍ය බලය ලබා දී ඇත. ඒ අනුව දරුවකු සම්බන්ධයෙන් වන ඕනෑම පැමිණිල්ලක් සිදු කිරීමට පැය විසි හතරම ක්‍රියාත්මක වන සේවාවක් වශයෙන් ළමා ආරක්ෂක අධිකාරිය විසින් 1929 ළමා උපකාරක සේවාව ආරම්භ කර ඇත. මෙමගින් අදාළ සිදුවීම පිළිබඳව හැකි ඉක්මනින් විමර්ශන කටයුතු සිදුකර අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. දරුවකු අන්තර්ජාලය ආශ්‍රිතව ලිංගික සූරාකෑමට ලක් වූ අවස්ථාවක දී වුවද ඒ සම්බන්ධයෙන් 1929 ළමා උපකාරක සේවාවට පැමිණිලි කිරීමේ හැකියාව ඇත. අංක 330, තලවතුගොඩ පාර, මාදිවෙල, ශ්‍රී ජයවර්ධනපුර හෝ දුරකථන අංක 0112 778911-2-3-4 යන ලිපිනය හා දුරකථන මාර්ගය ඔස්සේ ද සම්බන්ධ විය හැකිය.